# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2015 ඔක්තෝබර් මස 06 වන දින පෙ.ව.9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂනායකතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සහ කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/VI (1) /15/27)

අ) බස්නාහිර පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය සතු වාහන අධ්‍යක්ෂතුමාගේ පාලනයෙන් බැහැරව බාහිර පුද්ගලයින්ට ලබාදි තිබූ බව පිළිගන්නේද?

ආ) එසේ බාහිරව ලබා දි තිබූ වාහන සංඛ්‍යව කොපමණද?

ඇ) එම වාහන වර්ගය හා ලියා පදිංචි අංක සඳහන් කරන්නේද?

ඈ) එම වාහන නිදහස් කර තිබුනේ රියදුරන් සමගද?

ඉ) රියදුරු වැටුප්, ඉන්ධන, අළුත්වැඩියා හා සේවා කටයුතු ඇතුළු අනෙකුත් වියදම් දරන ලද්දේ?

(I) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින්ද?

(II) නොඑසේනම් කවුරුන් විසින්ද?

ඊ) මෙම වාහන අතුරින් කොපමණ සංඛ්‍යාවක් ආපසු භාර දි තිබේද? එම ආපසු භාරදි ඇති වාහන වල ලියා පදිංචි අංක හා ආපසු භාර දුන් දිනයන් සඳහන් කරන්නේද?

උ) භාර නොදුන් වාහන කොපමණ ද? ඒවායේ වර්ගය හා ලියා පදිංචි අංකය සඳහන් කරන්නේද?

ඌ) එම භාර නොදුන් වාහන භාවිතා කරන්නේ කවුරුන් විසින්ද?

(I) එම භාර නොදුන් වාහන පිලිබඳව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග කවරේද?

02. ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI (1) /15/28)

අ) කෝට්ටේ ආනන්ද බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය හා සම්බන්ධව කරන ලද විමර්ශනයේ වාර්තාව ඔබතුමාට ලැබුනාද?

ආ) එහි සඳහන් චෝදනා මොනවාද?

ඇ) එම වාර්තාව සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද?

ඈ) විදුහල්පතිනිය විසින් විදේශ නිවාඩු අනුමත කර නොගෙන පාසැල් දරුවන්ද සමග මැලේසියාවේ සංචාරයක යෙදී ඇති බවත්, එම සංචාරයට සහභාගි වූ පාසැල් දරුවන්ගේ පැමිණීම ලේඛනවල සටහන්ව ඇති බවත් ඔබතුමා දන්නවාද?

ඉ) ඒ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

ඊ) එම සංචාරය පිළිබඳව විමර්ශන වාර්තාවේ සඳහන්ව තිබේද?

උ) විමර්ශන වාර්තාව සභාගත කරන්නේද?

03. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI (1) /15/29)

අ) බස්නාහිර පළාත තුළ ගුරුවරුන් සඳහා ගුරු කාර්ය සාධන පත්‍රිකාවක් පළාත් අධ්‍යාපන කාර්යාලය මගින් ඉදිරිපත් කර තිබේද?

ආ) එම ගුරු කාර්ය සාධන පත්‍රිකාව ගුරුවරයාගේ වැටුප් වර්ධකය දීමට උපයෝගී කරගන්නා ලෙස උපදෙස් දී තිබේද?

ඇ) ගුරු කාර්ය සාධන පත්‍රිකාව ලබඳී නොමැති ගුරුවරුන්ට වැටුප් වර්ධක ලබා නොදෙන ලෙස උපදෙස් දී තිබේද?

ඈ) එම කාර්ය සාධන් පත්‍රිකාව ගුරු සංගම් නියෝජිතයන්ගේද අනුමැතිය ඇතිව කරනු ලැබුවක්ද?

ඉ) එසේනම් ඒ කවර ගුරු වෘත්තීය සංගම්ද යන වග සභාවට ඉදිරිපත් කළ හැකිද?

ඊ) එකී කාර්ය සාධන පත්‍රිකාව සියලු කලාපවලට ලබාදුන් එකක්ද? එසේ නොමැති නම් තෝරාගත් කලාප කිහිපයකට පමණක් දෙනු ලැබුවක්ද?

04. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/30)

අ) ශිෂ්‍යය සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම නිසා බප/කැළ/හීන්කෙන්ද ප්‍රාථමික විද්‍යාලය වසා දැමීමට නියමිතව තිබූ බව ඔබතුමා දන්නවාද?

ආ) එසේ වුවද ගම්වාසීන්ගේ මැදිහත්වීමෙන් මෙම විද්‍යාලය හීන්කෙන්ද මහා විද්‍යාලයට ඒකාබද්ධ කර සංවර්ධනය කළ බව ඔබතුමා දන්නේද?

ඇ) දැනට මෙම විද්‍යාලයේ ශිෂ්‍යය සංඛ්‍යව 665(1--5 ශ්‍රේණිවල) දක්වා ඉහළ ගොස් ඇති බව ඔබතුමා දන්නේද?

ඈ) දැනට මෙම පාසලට තිබෙන ඉල්ලුම හේතුවෙන් පාසලට ප්‍රවේශ වන ශිෂ්‍යය සංඛ්‍යා ඉහළයාම හේතුවෙන් තිබෙන සමාන්තර පංති සංඛ්‍යව 3 සිට 4 දක්වා වැඩි කිරීමට කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුමැතිය ලැබී ඇති බව ඔබතුමා දන්නවාද?

ඉ) එසේ වුවද එම පංති කාමර වැඩි කිරීමට සමාන්තරව අවශ්‍ය ගුරුවරුන් ද ගොඩනැගිලි පහසුකම්ද තවමත් සපයාදී නොමැති බව ඔබතුමා දන්නවාද?

ඊ) මෙම පාසලට අවශ්‍ය ගුරුවරුන් ලබාදී පංති කාමර පහසුකම් සකසා දෙන්නේද?

උ) එසේ නම් ඒ කවදාද?

05. ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත්පාලන හා පළාත් පරිපාලන, අර්ථික ප්‍රවර්ධන විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/31)

අ) ගොරකපිටිය ප්‍රදේශයේ පිහිටි බිපිං ලංකා කර්මාන්ත ශාලාවේ වර්ග අඩි 37000 ක ගොඩනැගිලි සැලැස්මක් කැස්බෑව නගර සභාව විසින් එහි නිල කාලය අවසන් වීමට සති කිහිපයකට පෙර 2015-03-04 දින අනුමත කර තිබේද?

ආ) එම ගොඩනැගිලි සැලැස්ම අනුමත කර දින 14 ක් තුළ අනුකූලතා සහතිකයද නිකුත් කර ඇති බව ඔබතුමා දන්නවාද?

ඇ) මීට වසර කිහිපයකට පෙර අනුමැතියකින් තොරව ඉදිරිපත් කර ඇති මෙම ගොඩනැගිල්ල සඳහා පසුව වංචනික ලෙස අනුමැතිය ලබා දීම හේතුවෙන් ප්‍රාදේශිය සභාවට සිදුව ඇති අලාභය කොපමණද?

ඈ) මේ ආකාරයට අයථා ලෙස අනුමැතිය ලබා දිමට කටයුතු කළ නිලධාරීන් සම්බන්ධව ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද?

ඉ) මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් විසින් ගෙන ඇති පියවර කවරේද?

06. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/32)

අ) අධ්‍යාපනය වෙනුවෙන් දළ ජාතික නිෂ්පාදනයෙන් 6% ක් වෙන්කල යුතු බවට වන රටේ ජාතික ආණ්ඩු වැඩ පිළිවෙලට ඔබතුමා එකඟ වන්නේද?

ආ) එයට අනුගතව බස්නාහිර පළාත් පාසල් සංවර්ධනය සඳහා සුදානමක් පවතිද?

ඇ) 2016 පළාත් පාසල්වලට පළමු ශ්‍රේණියට, හයවන ශ්‍රේණියට හා උසස්පෙළ ශ්‍රේණිවලට ළමුන් ඇතුලත් කරගැනීමේදී දෙමව්පියන් විසින් පාසලට ගෙවිය යුතු මුදල් වෙන් වෙන් වශයෙන් මොනවාද?

ඈ) දෙමව්පියන් විසින් භෞතික සම්පත් ලෙස පාසලට දිය යුතු දෑ තිබේද?

ඉ) එයට අමතරව මුදල් හෝ උපකරණ, ප්‍රදානයන් ලබාදෙන ලෙස විදුහල්පතිවරුන් දෙමව්පියන්ට බලපෑම් කරන්නේ නම් ගන්නා පියවර කවරේද?

ඊ) නොඑසේ නම් ඒ මන්ද?

07. ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/33)

අ) 2015 ජනවාරි 01 දින සිට 2015 සැප්තැම්බර් 01 දින දක්වා කාලය තුල එක් එක් ක්‍රීඩාවන් සඳහා වෙන් කළ මුදල කොපමණද?

ආ) එක් එක් ක්‍රීඩාව සඳහා වැය කළ මුදල කොපමණද?

ඇ) දිස්ත්‍රික්ක අනුව වැය කළ ආකාරය කෙසේද?

ඈ) ප්‍රතිලාභ ලැබූ ක්‍රීඩා සමාජ හා එම ක්‍රීඩා සමාජවලට වෙන් කළ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද?

ඉ) මිලදී ගත් භාණ්ඩ වර්ග මොනවාද? කොපමණ ප්‍රමාණයන්ද? එම භාණ්ඩ මිලදී ගත් ආයතන මොනවාද? හා වැය කළ මුදල කොපමණද?

ඊ) බස්නහිර පළාත් ක්‍රීඩා ක්ෂේත්‍රය වෙනුවෙන් වැය කිරීම් වලදී මුදල් බෙදී ගිය ආකාරය පිළිබඳ දූෂණ හා අක්‍රමිකතා සිදුවී ඇති බව ඔබතුමා දන්නේද?

උ) එසේ නම් ඊට ගනු ලබන පියවර කවරේද?

08. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/34)

අ) I) බස්නාහිර පළාත තුළ පවතින පෙර පාසැල් ඔබ අමාත්‍යාංශයට අයත් වන්නේද?

II) එසේ වන්නේ නම් ඒ කුමන ප්‍රතිපාදන යටතේද?

ආ) I) පෙර පාසැල් සම්බන්ධව විෂයභාර අධ්‍යක්‍ෂවරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තනතුරුලාභීන් ලෙස සිටිද?

II) ඒ කුමන ප්‍රතිපාදන යටතේද?

III) ප්‍රධාන අමාත්‍යවරයා විසින් පසුගිය දිනක ප්‍රසිද්ධ රැස්වීමකදි එලෙස අධ්‍යක්‍ෂවරු සිටින බව ප්‍රකාශකල බව ඔබතුමා දන්නේද?

ඇ) I) මේ වන විට පළාත තුළ පවතින රජයේ පාසැල් ගොඩනැගිලි කීයක පෙර පාසල් පවත්වාගෙන යන්නේද?

II) ඒ කවර ප්‍රතිපාදන යටතේද?

III) එම පාසල්තුල පෙර පාසැල් පවත්වා ගෙන යාමට තීරණය කළේ කවුරුන් විසින්ද?

09. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු සෞඛ්‍ය දේශිය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්‍ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/35)

අ) බ.ප.ස. මගින් පාලනය වන මහල් 6කින් යුත් මීගමුව රෝහල් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට නිර්දේශ වී තිබේද?

ආ) එකී ඉවත් කරන ගොඩනැගිල්ල වෙනුවට නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නිර්දේශ කර තිබේද?

ඇ) එවැනි නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමතිවරයා විසින් රු.මිලියන 500ක් ලබා දීමට එකහවිද?

ඈ) එකී ගොඩනැගිල්ල ඉදිකිරීමට සැලසුම් සකස් කර තිබේද?

ඉ) එකී ගොඩනැගිල්ල ඉදිකරන තෙක් රෝගීන් මුහුණ දෙන ප්‍රශ්න විසදීමට ගෙන ඇති පියවරයන් කවරේද?

10. ගරු එච්.බී.සුනිල් ජයමිණි - සභානායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නිතිය හා සාමය, පළාත්පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිලිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/36)

අ) කැස්බෑව නගර සභාවේ වර්තමාන ලේකම්වරිය 2015.09.20 දින වන විට වයස 60 ඉක්මවූ සේවකයන් 04 දෙනෙකු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනවලට පරිබාහිරව සේවයේ යොදවා ඇති බව ඔබතුමා දන්නෙහිද?

ආ) මෙම සේවකයන් බඳවා ගැනීම එතුමියගේ තනි කැමැත්ත මත සිදුවී ඇති බව ඔබතුමා දන්නේද?

ඇ) මෙම කරුණ සම්බන්ධව ලේකම්වරියට එරෙහිව විනය ක්‍රියා මාර්ගයක් ගන්නේද?

ඈ) නොඑසේ නම් ඒ මන්ද?

ඉ) වයස 60 ඉක්ම වූ සේවකයන් සේවයෙන් ඉවත් කිරීමට ඔබතුමා කටයුතු කරන්නේද?

ඊ) නොඑසේ නම් ඒ මන්ද?

## VI. නොපැමිණීම සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

# IX . පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

## 01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා:

" බස්නාහිර පළාත තුළ මේ වන විට පාසැල් දරුවන්ගෙන් දෙමාපියන්ගෙන් විටින්විට මුදල් අයකිරීම් සිදුවේ, පළමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුලත්කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මෙලෙස මුදල් එකතුකිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත්වී ඇත. එබැවින් බස්නාහිර පළාත තුල දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මුදල් එකතුකිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි "

(යෝ/VI (1) /14/09)

## 02. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා:

" බස්නාහිර පළාත් පාසැල් සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත්කර ගැනීමේදී දරුවන් හා දෙමවුපියන් පීඩාවට පත්කරන වර්තමාන ක්‍රමවේදය වෙනස්කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා දරුවන් පාසලට ඇතුලත්කර ගන්නා දින සිට මාසයක් ඉක්ම යාමට පෙර සියලු පුරප්පාඩු පුරවා අවසන් කිරීමත්, ආරක්ෂක අංශවල සේවයේ නියුක්ත වුවන්ගේ දරුවන්ගේ නාම ලේඛනය දරුවන් ඇතුලත් කර ගත් දිනයේ සිට සති 3 ක් ඉක්ම යාමට පෙර පළාත් සභාවට ලැබීමට සැලැස්වීමත්, පාලක පක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන නාම ලේඛණයට අනුව ළමුන් ඇතුලත් කර ගන්නා ක්‍රමය අහෝසි කිරීමත්, සම්මුඛ පරීක්ෂණ වලට සහභාගි වන සෑම දරුවෙකුටම ලැබෙන ලකුණු අනුව ස්ථිර ලේඛනයක් ලකුණු අනුපිළිවෙලට අනුව සකස් කිරීමත් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පාසලට දරුවන් ඇතුලත් කිරීමට පියවර ගැනීමත් කළ යුතුයැයි ද, ඒ අනුව බස්නාහිර පළාතේ පාසැල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේ කටයුතු විධිමත් කර පාසලකට දරුවෙකු ඇතුලත් කිරීමට තිබෙන මානව අයිතිය පළාතේ ජනතාවට තහවුරු කළ යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

(යෝ /VI (1) /14/10)

# X . සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.09.23 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.